(14)

1990-1-

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 15 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1989 නොවැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

221659

# 1989 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 36/88

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1989 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතේ 188 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 188 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) (2) වන උපවගන්තියෙහි සඳහන් නිදහස් කිරීමේ ආඥාවක්,—

(අ) එය ඉවතලනු නොලැබ චූදිතයාට විරුද්ධව නඩුව, ඒ ආඥාවේ දිනයෙහි සිට එක් අවුරුද්දක කාල සීමාවක් ඇතුළත නැවත ආරම්භ කරනු නොලබන්නා වූ; හෝ

(ආ) නඩුව යථා පරිදි නැවත ආරම්භ කර දෙවන වරට නිදහස් කිරීමේ ආඥාවක් කරනු ලැබ ඇත්තා වූ; හෝ

අවස්ථා දෙකින් කවර අවස්ථාවක වුවද ඒ නිදහස් කිරීමේ ආඥාව, නිදොස් කිරීමක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය:

එසේ වුව ද, නිදහස් කිරීමේ ආඥාවක් ඉවත ලන ලෙස කරන ලද ඉල්ලීමක් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ හෝ වෙනත් යම් අධිකරණයක් ඉදිරියේ ප්‍රතිශෝධනය සඳහා විභාග වෙමින් පවතින අවස්ථාවක, නිදහස් කිරීමේ ආඥාව ඉවත ලන ලෙස වූ ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් හෝ ඒ අධිකරණය විසින් හෝ කරනු ලබන තෙක්, ඒ නිදහස් කිරීමේ ආඥාව එක් අවුරුද්දක කාලසීමාව අවසානයේ දී නිදොස් කිරීමක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු ය.".